පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව සබරගමුව - සති පාසල

**විෂය : ඉතිහාසය**

**1 වාරය සතිය - 1**

**ශ්‍රේණිය : 6**


**සකස් කිරීම : මාවනැල්ල කලාපය, කමලා වික්‍රමසිංහ මිය**

Department of Education Sabaragamuwa Province/ Weekly School

**1 පාඩම**

## ඉතිහාසය හැඳින්වීම

- ඉතිහාසය යනු අතීත කාලයේ ජීවත් වූ මිනිසුන් ගැන තොරතුරු සොයා බලා ඒවා පැහැදිලි කිරීමයි.
- අප ඉතිහාසය ගැන දැන ගන්නේ,
    - පැරණි කාලයේ ලියවුණු පොත පත වලින්,
    - අතීත මිනිසුන් පරිහරණය කර දැනට ඉතිරිව තිබෙන භාණ්ඩ වලින්,
    - අතීතය පිළිබඳ වැඩිහිටියන්ගේ කථා ඇසුරෙන්,
- ඉතිහාසය පිළිබඳ අපට දැනුම ලබා ගැනුමට උපකාරී වන මේ සෑම දෙයක්ම "මූලාශ්‍ර" ලෙස හඳුන්වයි. මෙම මූලාශ්‍ර වර්ග දෙකකි.




**පෙළ පොත කියවා පහත අභ්‍යාසයෙහි යෙදෙන්න.**

1. පැරණි කාලයේ ජීවත් වූ මිනිසුන් ගැන තොරතුරු පහත දැක්වේ. ඒවා අදාල ස්ථානයේ ලියා දක්වන්න.

( පැරණි පොත්පත්, පැරණි ගොඩනැගිලි, කාසි, ජනකතා, මිනිස් ඇටසැකිලි, ජන කවි, ආහාරයට ගෙන ඉතිරි වූ දෑ, මැටි භාණ්ඩ, සෙල් ලිපි, වංශ කතා, පිළිම )

| සාහිත්‍ය මූලාශ්‍ර | පුරාවිද්‍යාත්මක මූලාශ්‍ර |
|---|---|
| | |

2. පහත ප්‍රහේලිකාව සම්පූර්ණ කරන්න.

| | | | | | | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | 1ම | | ව | | 6 | ය | | 7ප | | | |
| 2ග | | වි | | | ය | | ක | | | ස් | | 8බු | |
| | | | | | | | | | | | | | |
| 3ප | | | ම | | | | | | | | | | |
| | | | | | | | ශ | | | සි | | | |
| | | | 4මි | | | රි | | | | | | | |
| | | | | | | | | 9දී | | | | | ය |
| 5හි | | | | | ශ | | | | | ස | | | |

<u>හරහට</u>

1. දික්සඳ සෙනෙවියා පිරිවෙනෙහි මහානාම හිමි රචනා කරන ලද සාහිත්‍ය මූලාශ්‍රයකි.
3. පොළොන්නරු ගල්විහාරය ඉදිකළ රජු,
4. මහසෙන් රජු ඉදිකළ වැවකි.
5. මුස්ලිම් ආගමික උත්සව පැවැත්වීමේදී කාලය මැන ගැනීමට බාවිත කරන වර්‍ෂ ක්‍රමයකි.
9. ක්‍රි.ව. 4 වන සියවසෙහි රචිත පැරණිම සාහිත්‍ය කෘතිය.

<u>පහලට</u>

1. මහාවංශය රචනා කරන ලද්දේ,
2. 1 වන පරාක්‍රමබාහු රජු ඉදිකළ විහාරයකි,
6. හින්දු දින දර් ශනයකි,
7. මහා වංශය රචනාවූ කාලය,
8. ක්‍රි.පූ. 544 න් ආරම්භ වන්නේ,